**දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය**

**තනතුරු ඇබෑර්තු**

**104-09 වැ.ප. 111 ශ්‍රේණියේ කලමණාකාර සහකාර (පරිගණක ) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුර සඳහා සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීමට 2024.05.07 දින සිට.2024.05.21 දින දක්වා සමිති බල ප්‍රදේශය තුල වසර දෙකක ස්ථිර පදිංචිය සහිත බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ..

| තනතුර | වැ.ප අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| කලමණාකාර සහකාර (පරිගණක ) | 104 - 09 111 ශ්‍රේණිය | 01 | 21284 - 575x10-675x10-800x10-41,784/= |

02. මෙම තනතුර ස්ථිරය.සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවාගැනීමේ සුදුසුකම්

(අ) 105-10 වැටුප් පරිමාණයේ වසර 05 ක හෝ 105-11 වැටුප් පරිමාණයේ වසර 08 අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක පළපුරුද්ද සහ පිලිගත් ආයතනයක වසර (01) පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පො .ස (සා.පෙළ )විභාගයෙන් විෂයන් හයකින් සමත් වීම (ඉංග්‍රීසි විෂය සඳහා සම්මානයක් ලබා තිබීම අමතර සුදුසුකමකි ) සහ පරිගණක දත්ත ක්‍රියාකරණය පිළිබඳව රජයේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පාඨමාලාවක් සමත්ව තිබීම .

සැ .යු .

- පරිඝණකය මගින් සිංහල ලිපි සැකසීමට හැකියාව තිබීම අමතර සුදුසුකමකි .
- තෝරා ගන්නා අවස්ථාවේදී ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය .

04. වයස් සීමාව -අවුරුදු 18-45

(අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස සඳහන් කල යුතුය)සමූපකාර සේවයේ නියුත් අයට උපරිම වයස සීමාව බල නොපායි.

05. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කල හැකිය.

07. වෙනත් සමූපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයකු අයදුම්පත් යොමු කරන්නේනම් තම අයදුම්පත දැනට සේවය කරන සමිතිය හරහා එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයකු ාකලින්ම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සලකා බලනු නොලැබේ

08. අයදුම්පත්‍රය යොමු කිරීම

අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ සී/ස දූනගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ 104.9 වැටුප් පරිමාණයේ 111 ශ්‍රේණියේ කළමණාකරණ සහකාර (පරිගණක) තනතුර සඳහා බඳවා ගැනීම යන්න සඳහන් කල යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම් පතුය 2024.05.21 දිනට හෝ පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය(අතින් ගෙනවිත් භාරදීමටද හැකියාව ඇත.)මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

සභාපති,<br>
සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ,<br>
සමූපකාර සමිතිය

..............................දින සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේසමූපකාර සමිතිය<br>
සමූපකාර සමිති දූනාගහ. දු.අ 0312246564,0342243802